# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2089/22 - 2018 සැප්තැම්බර් මස 18 වැනි අඟහරුවාදා - 2018.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කළුතර නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතුකොට කළුතර නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කළුතර නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ ජයන්ති වීරසිංහ අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කළුතර නගර සභාවේ තෝරා ඒවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කන්ද බදුගේ දුසිල් කමලාවතී ප්‍රනාන්දු නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද ;

කළුතර නගර සභාවේ තේරීම්භාර නිලධාරී පහල රාලලාගේ නාලක හේමන්ත රත්නායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් කන්ද බදුගේ දුසිල් කමලාවතී ප්‍රනාන්දු, කළුතර නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

නාලක රත්නායක,
තේරීම්භාර නිලධාරී,
කළුතර නගර සභාව.

2018 සැප්තැම්බර් මස 17 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කළුතර.

10 - 47

1A - G 28550 — 17 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*